**තත්‍යාග හා දිරි දීමනා අරමුදල - 2013**

තත්‍යාග හා දිරි දීමනා අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද මෝටර් වාහන පනතේ (203 පරිච්ඡේදය) 213 ඇ (5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස තත්‍යාග හා දිරිදීමනා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

අරමුදලේ ගිණුම් පිළියෙල කිරිමේදි හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.692,119 ක් වූ ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළී හා භාණ්ඩාගාර බිල්පත් පොළී ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් වෙත දිරි දීමනා ගෙවීමේදි අයකරගත් උපයන විට ගෙවීම් බදු රු.59,538 ක් දිරි දීමනා ගිණුමට ගැළපුම් කිරීම වෙනුවට අරමුදලේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙසේ අයකරගත් මුදලද නියමිත ප්‍රමාණයට වඩා රු.17,424 ක් වැඩිපුර අයකරගෙන තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371(2) | අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත් එසේ කිරීමකින් තොරව මාස 06 ක් ඉක්මවීමෙන් පසු පියවූ අවස්ථාවක් නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 372 | දෙපාර්තමේන්තුවක් හෝ කාර්යාලයක් හෝ භාරයේ තිබෙන අග්‍රිමයන් නැතහොත් අතුරු අග්‍රිමයන් පරීක්ෂා කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ ඒ සඳහා බලය දෙනු ලැබූ වෙනත් නිලධාරියෙකු විසින් අවම වශයෙන් මාසයකට එක් වරක්වත් පරීක්ෂණයක් කළ යුතු වුවද, අරමුදලේ අත්තිකාරම් ලේඛණය එවැනි පරීක්ෂණයකට ලක්කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2001 ජුලි 10 දිනැති අංක 17/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව වයස අවුරුදු 60 එළඹීමෙන් පසුව විශ්‍රාම ගිය නිලධාරිනියක් කොන්ත්‍රාත් පදනම මත අරමුදලේ මූල්‍ය පාලක ලෙස පත්කිරීමට කටයුතු කර එම නිලධාරිනියට සමාලෝචිත වර්ෂයේදී රු.420,000 ක දීමනාවක් ගෙවීමට කටයුතු කර තිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.2 (ආ) ඡේදය | ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්ත මුදල් අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම හා අතිරික්ත අරමුදල් බාහිර ආයතනයන්හි ආයෝජනය කර ඇති විටෙක ඒවා කල්පිරුණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරු කළ යුතු වුවද, අරමුදලේ රු.29,000,000 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2011 අංක 04 දරන මෝටර් වාහන නියෝගය | නියෝගය අනුව කාර්යයන්ට වාර්ෂිකව වියදම් කළ හැකි වියදම් සීමාව සඳහන් වුවත්, එම සීමාව ඉක්මනොවූ ඉතිරි මුදල වූ රු.2,316,902 ක් සංචිත ගිණුම් 04 කට බැර කර තිබුණි. |

### 2.4 අධිකාරී බලය නොලත් ගෙවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 (ඇ) උපඡේදය පරිදි සියලුම දීමනා හා දිරි කාරක ගෙවීම් පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විමසා උපදෙස් නිකුත් කිරීම් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කිරීමකින් තොරව නිලධාරීන් සඳහා එකතුව රු.95,513,462 ක් දිරිදීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ සෘජුවම කාර්යභාරයක් ඉටු නොකරන ප්‍රවාහන අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇති සංවර්ධන සහකාර නිලධාරීන් දෙදෙනෙකු ඇතුළු 04 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.217,176 ක් දිරි දීමනා වශයෙන් ගෙවීම් කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු.4,799,765 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.3,719,592 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,080,173 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පත් සඳහා ලැබූ රු.1,518,315 ක පොළිය මෙම අතිරික්තය වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 නිෂ්කාර්ය සම්පත්**

අරමුදලේ රුපියල් මිලියන 40 කට වැඩි මුදලක්, භාණ්ඩාගාරයේ අතිරික්ත ගිණුමේ තැන්පත් කිරීමට කටයුතු නොකර මාස 03 කට වැඩි කාලයක් ජංගම ගිණුමක නිෂ්කාර්යව පැවතුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) මෝටර් වාහන සකස් කිරීම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, අළුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම හා නිර්මාණය වෙනස් කිරීම ආදී කටයුතු සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද, එසේ අනුමැතියකින් තොරව සිදු කෙරෙන අනීතික කටයුතු පිළිබඳ තොරතුරු සපයන්නන්ට ත්‍යාග මුදල් ගෙවීම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණක් වුවද, සමාලෝචිත වර්ෂයේදී එවැනි තොරතුරු සපයන්නන්ට කිසිදු ගෙවීමක් කර නොතිබුණි.

(ආ) මෝටර් වාහන සම්බන්ධයෙන් විවිධ සාවද්‍ය ක්‍රියාවන්හි නියුක්තව සිටින තැනැත්තන් පිළිබඳව තොරතුරු සපයන තැනැත්තන්ව බිහි කිරීමත්, එවැනි තොරතුරු සැපයීමට ඔවුන්ව ධෛර්යමත් කිරීමත් මෙවැනි සාවද්‍ය ක්‍රියාකාරකම්වල නියුක්තව සිටින තැනැත්තන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිලධාරීන්ව ධෛර්යමත් කිරීමත් ත්‍යාග අරමුදල පිහිටුවීම මඟින් බලාපොරොත්තු වූ කටයුත්තක් වුවද, එවැනි තොරතුරු සපයන්නන් සහ නිලධාරීන් ධෛර්යමත්වන ආකාරයේ කිසිදු ක්‍රියාකාරකමක් අරමුදල විසින් සිදු කර ඇති බවට තොරතුරු විගණනයට අනාවරණය නොවුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

අරමුදලේ ලැබීම්වලින් පරිපාලන කටයුතු සඳහා සියයට 1 ක මුදලක් වෙන් කිරීමට කටයුතු කර තිබුණද, 2011 අංක 4 දරන මෝටර් වාහන නියෝගවල සියයට 1 ක යන්න නිශ්චිතව සඳහන් වී නොතිබුණු අතර පරිපාලන වියදම් සඳහා ගෙවනු ලැබීමට නියමිත මුදල් ලෙස සඳහන් කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

ත්‍යාග හා දිරි දීමනා අරමුදලට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි.

**5.2 අයවැය පාලනය**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා ගෙවීම් සම්බන්ධයෙන් අයවැය ඇස්තමේන්තුව හා තථ්‍ය වියදම් අතර එකතුව රු.11,981,732 ක විචලතා පැවතුණි. ඒ අනුව අයවැය සකස් කිරීම නිසි අයුරින් සිදුකර නොතිබුණු අතර අයවැය ලේඛණ ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබුණි.

**5.3 නොවිසඳී ඇති විගණන ඡේද**

**-----------------------------**

මෝටර් වාහන සම්බන්ධයෙන් විවිධ ආකාරයේ සාවද්‍ය ක්‍රියාවන් සිදුකරන ලද තැනැත්තන් සහ නිලධාරීන් පිළිබඳව මාගේ අංක SC/C/DMT/2010/03, SC/C/DMT/2010/04 හා TH/D/RMV/06 විමසුම් මඟින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත පෙන්වා දී තිබුණද, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

**-----------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය

(ආ) ගිණුම්කරණය